**හෝමියෝපති වෛද්‍ය සභාව - 2020**
**---------------------------------------------**

**1.1 මතය**
-------

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

වෛද්‍ය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, වෛද්‍ය සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වෛද්‍ය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

වෛද්‍ය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වෛද්‍ය සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වෛද්‍ය සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් වෛද්‍ය සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ වෛද්‍ය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ වෛද්‍ය සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, වෛද්‍ය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

**1.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ 5(1) ඡේදය | නිලධාරියෙකුගේ සේවය අවසන් කිරීමේ දින සිට දින තිහක් ඇතුළත පාරිතෝෂිකය ගෙවිය යුතු වුවද, 2020 මැයි 15 දින සේවයෙන් ඉල්ලා අස්වී තිබුණු ඖෂධ සංයෝජකයෙකු ලෙස වර්ෂ 5 ක් සේවය කළ නිලධාරියෙකුට 2020 දෙසැම්බර් 31 දින වනවිටත් රු.77,205 ක් වූ පාරිතෝෂිකය ගෙවා නොතිබුණි. | ඖෂධ සංයෝජක නිලධාරියා ඉල්ලා අස්වන කාලයේදී වෛද්‍ය සභාවක් නොතිබුණු බව හා නව වෛද්‍ය සභාව යටතේ මෙම පාරිතෝෂිකය කඩිනම්ව ගෙවා අවසන් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | පාරිතෝෂිත ගෙවීම් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ සුතුය. |
| (ආ) 2016 අංක 10 දරන හෝමියෝපති පනත | | | |
| (i) 28 (6) උප වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හා හිඟහිටි ගාස්තුව හඳුනා ගැනීමට හැකි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | වෛද්‍යවරුන් ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සඳහා ගෙවන ගාස්තු සඳහන් ලේඛනයක් පවත්වා ගෙන යාමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමේ ලේඛනය, ලියාපදිංචිය අළුත් කිරීම් හා අළුත් නොකිරීම් හඳුනාගත හැකි පරිදි යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 30 වගන්තිය | හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්විය යුතු වුවද, විභාගය පැවැත්වීම සඳහා වූ නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන්කර නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණු විභාගය, 2021 ජුනි 30 දින වනවිටත් පැවැත්වීමට නොහැකිවීමෙන් වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම ප්‍රමාදවී තිබුණි. | නීති සහ රෙගුලාසි සකස් කර අවසන්ව ඇති බව හා රෙගුලාසි ගැසට් කිරීමෙන් අනතුරුව විභාගය පවත්වා ලියාපදිංචිය ලබා දීමට හැකියාව පවතින බව. | නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම කඩිනම් කළයුතු අතර ප්‍රමාදයකින් තොරව වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට කටයුතු කළ සුතුය. |
| (iii) 31(1) උප වගන්තිය | හෝමියෝපති ඖෂධවේදීන් ලියාපදිංචිකිරීම සඳහා හෝමියෝපති ඖෂධවේදී ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වුවද, මෙම විධිවිධාන ක්‍රියාත්මකකිරීම සඳහා වූ රෙගුලාසි පිළියෙලකර නොතිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් එවැනි ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | රෙගුලාසි සැකසීම සඳහා කමිටුවක් පිහිටුවා ඇති බව, රෙගුලාසි සැකසීම කඩිනම්ව සිදු කිරීමට කටයුතු කරමින් සිටින බව හා ඖෂධවේදීන් ලියාපදිංචිය ඉතා ඉක්මනින් සිදු කිරීමට බලා පොරොත්තු වන බව. | රෙගුලාසි පිළියෙලකර පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ සුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 133 | සභාව සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අමාත්‍යාංශය සමඟ එක්ව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට අදහස් කරන බව හා දැනට විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා ඇති බැවින් එය කඩිනමින් රැස් කර එම කටයුතු ඉක්මනින් සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 751 | ආයතනයට ලැබෙන සියළුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි ඇතුළත් කළ යුතු වුවද, 2018 වර්ෂයේදී මිලදීගත් රු.644,634ක හා සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.885,892 ක් වූ භාණ්ඩ පොදු ද්‍රව්‍ය හා ශල්‍ය | 2018 වර්ෂය වෛද්‍ය සභාවක් නොමැතිව ගෙවී ගිය වර්ෂයක් වන බව, සමාලෝචිත වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය මත ලේඛන යාවත්කාලීන කිරීම ප්‍රමාද වූ බව, 2020 සැප්තැම්බර් මාසයේදී නව වෛද්‍ය සභාව | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ද්‍රව්‍ය ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. | පිහිට වූ පසු තොග පොත් යාවත්කාලීන කිරීමටත් ද්‍රව්‍ය මිලදී ගන්නා අවස්ථාවේදීම අදාළ ලේඛනවලට ඇතුලත් කිරීමටත් නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | |
| | (iii) මුදල් රෙගුලාසි 754 | සෑම මුදල් වර්ෂයකම අවසානයේ බඩු ලේඛන පොත තුලනය කළ යුතු වුවද, 2019 වර්ෂයේ සිට පොදු ද්‍රව්‍ය ලේඛනය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනය තුලනය කර නොතිබුණි. | පවතින කොවිඩ් වාතාවරණය හමුවේ පැවති රට වසා දැමීම් වැනි තත්වයන් නිසා බඩු ලේඛන පොත තුලනයේ යම් ප්‍රමාදයන් සිදුව ඇති බව හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පොදු ද්‍රව්‍ය ලේඛනය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනය කඩිනම්ව තුලනය කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | -එම- |
| | (iv) මුදල් රෙගුලාසි 756 | ආයතනයේ බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුවත්, 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු ඉතා ඉක්මනින් සිදු කිරීමට, අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය | කාර්යක්ෂමතා කඩඉම්වලින් උසස් කිරීමේ විභාග නියමිත දිනවල පැවැත්වීමට ආයතන ප්‍රධානී වගබලා ගතයුතු වුවත්, 2012, 2014 හා 2015 වර්ෂවලදී බඳවාගෙන තිබුණු තනතුරු 04 කට අදාළව නිලධාරීන් 20 දෙනෙකු වෙනුවෙන් විගණිත දිනය වන 2021 ජුනි 30 දින වනවිටත් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් අදාළ නිලධාරීන් සේවයෙහි ස්ථිර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි. | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | මෙම විභාග පැවැත්වීම කඩිනමින් සිදු කළ යුතු අතර එතෙක් නිලධාරීන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2018 නොවැම්බර් 14 දිනැති අංක 2/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවද, 2009 වර්ෂයේදී අයකර තිබුණු රු.1,204,500 ක් වූ පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.1,953,157 ක් විය. | එම මුදල් මෙම ගිණුමෙන් ඉවත්කර ලංකා බැංකුවෙහි පවත්වා ගෙන යමින් සිටින හෝමියෝපති අරමුදලෙහි වෙන්කර තැබෙන මුදලක් ලෙස තැන්පත් කිරීමට නව වෛද්‍ය සභාව අමාත්‍යාංශය සමඟ එක්ව ක්‍රියාකරමින් සිටින බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,719,379 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාව රු.141,689 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,577,690 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා සහ පාරිතෝෂික දීමනා වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි. | වෛද්‍ය සභාවේ සියළුම සැලසුම් වෛද්‍ය සභාවේ යෝජනා මත සකස් කෙරෙන බැවින් වෛද්‍ය සභාව පත්කර නොතිබීම වාර්ෂික සැලැස්මක් සකස් නොකිරීමට හේතු වූ බව හා 2020 සැප්තැම්බර් 09 වන දින පත් කරන ලද නව වෛද්‍ය සභාව විසින් ඉදිරි වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට සැලැසුම් සකස් කරන බව. | හෝමියෝපති වෛද්‍ය සභා පනතෙහි ඇති අරමුණු ඉටුකර ගැනීමට හැකි පරිදි ක්‍රියාකාරී සැලසුම් පිළියෙලකර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහජන මුදල් රැස්කිරීම සඳහා බලයක් ලැබෙන කිසිදු ප්‍රතිපාදනයක් නොමැතිව හා විධිමත් අනුමැතියකින් තොරව“හෝමියෝපති අරමුදල” නමින් එකක් රු5.,000ක වටිනාකමක් සහිත ආධාර පත්‍ර පොත් මුද්‍රණය කර තිබුණි .මුද්‍රණය කළ වර්ෂය, මුද්‍රණය කළ මුළු ආධාර පත්‍ර සංඛ්‍යාව, ආධාර පත්‍ර අලෙවි ආදායම හා එම මුදල් බැංකුගත කිරීම පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි. පැවති පහළම පොත් අංකය හා ඉහළම පොත් අංකය අතර පොත් 159ක හිඟයක් පැවති අතර එමගින් රැස්කළ හැකිව තිබුණු මුළු මුදල රු.795 000,ක් විය.ඉන් පොත් 416ක තොගයක් ඉතිරිව පැවතුණු අතර එම ආධාර පත්‍ර පොත් අවලංගු කිරීමට හෝ අපහරණය කර ඉවත් කිරීමට 2021 ජූලි 15 තෙක් කටයුතු කර නොතිබුණි. | 2009 ඔක්තෝබර් මාසයේදී එවකට විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් විවිධ චෝදනා මත විසුරුවා හැරුණු වෛද්‍ය සභාව විසින් මුද්‍රණය කරන ලද මෙම ආධාර පත්‍ර සහිත පොත් පිළිබඳ අදාළ තීරණ, සිදු කළ ගණුදෙනුද සහිත කරුණු ඇතුළත් ලිපි ගොණු කිසිවක් වෛද්‍ය සභාව සතුව නොපවතින බව ලේඛකාධිවරයා දන්වා ඇති බව, මේ සම්බන්ධව විමසා ඇති කරුණු පිළිබඳව අදහස් දැක්වීමට නොහැකි වන බව හා මෙම ආධාර පොත් විනාශකර දැමීමට ඉදිරිකාලයේදී අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීමට අදහස් කර ඇති බව. | මේ සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර මෙම ආධාර පත්‍ර පොත් තොගය අපහරනය කළ යුතුය. |

### 3.3 නිෂ්ක්‍රීය හෝ හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ විධිවිධානවලට අනුව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේ දී ඒ සඳහා රු.1,199,254 ක් වැයකර ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2021 ජූලි 15 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 12 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | 2009 වර්ෂයෙන් පසුව වෛද්‍ය සභාව ක්‍රියාත්මක නොවීම නිසා මෙම කටයුතු ඇණහිට තිබී ඇති බව, නව වෛද්‍ය සභාව විසින් මේ පිළිබඳව සොයා බලා වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා ඇති නීතිමය පසුබිම හා අනෙකුත් කටයුතු පිළිබඳව වාර්තා කිරීමට කමිටුවක් පිහිටුවා ඇති බව හා ඉදිරි කාලයේදී අමාත්‍යාංශය හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ එක්ව ඉදිකර ඇති ගොඩනැගිල්ල හා උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදා ගැනීමට අදහස් කර ඇති බව. | ඉදිකර ඇති ගොඩනැගිල්ල හා මිලදී ගෙන ඇති උපකරණ අදාළ අරමුණ වෙනුවෙන් යොදවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්යමණ්ඩලය 48 ක් වුවද, තථ්‍ය කාර්යමණ්ඩලය 37 ක් විය. සභාව සඳහා අත්‍යවශ්‍ය තනතුරුවන වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු හා ඖෂධ සංයෝජකවරු 08 දෙනෙකුගේ පුරප්පාඩු පිරවීමට 2021 ජුනි 30 දින වන විටත් අපොහොසත් වී තිබුණි. | 2021 ජූලි 12 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වා පුරප්පාඩු පිරවීමට කටයුතු කළ බව, ඖෂධ සංයෝජක බඳවා ගැනීම සඳහා සුදුසුකම වන NVQ Level 3 සුදුසුකම සහිත පාඨමාලාව ආරම්භ කිරීමට මේ වනවිට TVEC ආයතනය සමඟ කටයුතු කරමින් සිටින බව හා පාඨමාලාව ආරම්භ කළ පසු ඖෂධ සංයෝජක පුරප්පාඩු පිරවීමටද කටයුතු කරන බව. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |